# පාසැල් මට්ටමේ හරිත ආර්ථික ක්‍රියාකාරකම් තුළින් පරිසර හානිය අවම කිරීම

**නිමල් පෙරේරා**
ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරණ අධිකාරිය

**හරිත ආර්ථිකයක් යනු කුමක්ද**

හරිත ආර්ථික ක්‍රියාකාරිත්වයන් සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන විසින් අර්ථ දැක්වීමක් සිදු කර ඇති කිසියම් ව්‍යාපාරයක් හෝ වැඩසටහනක් මඟින් මිනිසාගේ යහපැවැත්ම සහ සාමාජීය සාමානාත්මතාවය ඉහළ නැංවීම පාරිසරික අවදානම අවම කිරීමට හා ස්වාභාවික සම්පත් රැක ගැනිමටත් ඉවහල්වන ක්‍රියාවක් ලෙසයි. ඉතා සරළව දැක්වුවහොත් හරිත ආර්ථිකයක් සැම විටම අඩු කාබන් මුදාහැරීමක් සිදු කරන ස්භාවික සම්පත් කාර්‍යක්‍ෂමව භාවිතා කරන සාමාජීය පදනමක් සහිත ක්‍රියාවකි.

ප්‍රායෝගිකව සැලකුවහොත් හරිත ආර්ථිකයක් ආදායම් ඉහළ නැංවීමටත්, රැකියා අවස්ථා බිහි කිරීමටත් හැකි රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජනයන් මඟින් ක්‍රියාත්මක වන කාබන් මුදා හැරීම මෙන්ම පරිසර දූෂණය අඩු කරන ක්‍රමවේදයකි. තවද එය බලශක්ති සහ ස්වාභාවික සම්පත් කාර්‍යක්‍ෂමතාවය ඉහළ නැංවිමට මෙන්ම සොබාදහමේ දායාදයන් ලෙස අපට හිමිව ඇති සොබාදහම් සේවාවන් අපට ලඟා කරවන ජෛව විවිධත්ව හානින් අවම කිරීමටත් ක්‍රියා කරයි. මෙවන් හරිත ආර්ථික ආයෝජනයන් දිරිගැන්වීම සහ ඒවාට සහය ලබා දීම සඳහා ආදාළ රාජ්‍ය වියහියදම් ප්‍රතිපත්ති සකස් කිරීම් සහ නීතිමය වෙනස්කම් සිදුවිය යුතුය. විශේෂයෙන්ම ස්වාභාවික සම්පත් මත තම ජීවිකාව රදාපවතින ජනතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් මෙවන් ආර්ථික සංවර්ධන රටාවන් සකස්කර වැඩි වර්ධනය කර පවත්වා ගැනීමටත් අවශ්‍ය විටදී ප්‍රති නිර්මාණය කිරීමටත් සිදුකළ යුතුය. තවද ස්භාවික සම්පත් ඉතා වැදගත් මෙන්ම අවධානම්කාරි තත්ත්වයක පවතින ආර්ථික වටිනාකම් මෙන්ම ඒවා පොදු මහජනතාවගේ සුබ සිද්ධිය සඳහා බවද සිහිතබා ගත යුතුය.

**හරිත ආර්ථිකයක් සඳහා මුල් පියවර**

2008 අග භාගයේදී එක්සත් ජාතින්ගේ පරිසර වැඩසටහන මුලින් ආරම්භ කරන ලද හරිත ආර්ථිකයන් මුල් පියවර කොටස් කිහිපයකින් සමන්විත වූ අතර සමූහයක් ලෙස ඒවායේ අරමුණ වුයේ පරිසර හිතකාමි නොවන ක්ෂේත්‍රයන් හරිත තත්ත්වයකට ගෙන ඒම පවතින හරිත ක්ෂේත්‍රයන්හි ආයෝජනයන් වැඩි වර්ධනය කිරීම සඳහා විශ්ලේෂණයන් සිදු කිරීමත් එතුළින් ප්‍රතිපත්තිමය අත්වැලක් ලබා දීමත්ය.

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන මුලිකව සකස්කරන ලද හරිත ආර්ථික මුල් පියවර ක්‍රියාකාරිත්වයන් තුනකින් සමන්විතය.

1. හරිත ආර්ථික වාර්තාවන් සම්පාදනය කිරීම සහ සාර්ව ආර්ථික ධරණීය හා දරිද්‍රතාවය පිටු දැකීම යන සංකීර්ණ කරුණුවල විශ්ලේෂණය සඳහා පර්යේෂණ සිදු කිරීම ඒ සඳහා යොදා ගත හැකි ක්‍රම වේදයන් වන තිරසාර කෘෂිකර්මාන්තය සඳහා පුනර්ජනනීය බලශක්තිය ආයෝජන හදුන්වාදීමත් එම ක්ෂේත්‍රයන්හි ආයෝජනයන් ඉහළ නැංවීම සඳහා ප්‍රතිපත්තිමය රාමු සකස් කිරීම.

2. තෝරාගත් රටවල්වල හරිත ආර්ථිකයන් ඉහළ නැංවීම සඳහා උපදේශක සේවාවන් ලබාදීම.

3. හරිත ආර්ථිකයන් ක්‍රියාත්මක කරවීම සඳහා පුළුල් ලෙස පර්යේෂණයන්හි යෙදීම රාජ්‍ය නොවන සංවිධානයන් සමග කටයුතු කිරීම ව්‍යාපාරික ක්ෂේත්‍රයන්හි සහ අනිකුත් එක්සත් ජාතීන්ගේ අනිකුත් හවුල්කාර ආයතනයන් එක්ව කටයුතු කිරීම.

## පාසැල් සඳහා හරිත ආර්ථික ක්‍රියාකාරකම්

1. පාසැල් මට්ටමෙන් බලශක්ති කළමනාකරණ කණ්ඩායම් පිහිටුවා සරල බලශක්ති විගණනයන් තුළින් බලශක්ති සංරක්ෂණය සඳහා කටයුතු කිරීම.



2. පාසැල්වල කාබන් පියසටහන පිළිබඳ ගණනය කිරීම්, පර්යේෂණ සිදු කිරීම හා වාර්තා පිළියෙල කිරීම.

3. පාසැල් ළමුන් අයත්වන විවිධ ප්‍රජාවන් තුළ බලශක්ති සුරැකීම ප්‍රවර්ධනය කිරීම.

4. පුනර්ජනනීය බලශක්ති ප්‍රභව (ස්වභාවික සූර්යාලෝකය වැනි) භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කිරීම මෙන්ම ලබාගත් සාර්ථක අත්දැකීම් වාර්තා කිරීම.

5. කඩදාසි සංරක්ෂණ (අඩුවෙන් ඡායාපිටපත් ගැනීම, මුද්‍රිත පොත් සුරක්ෂිතව භාවිත කර ඉදිරි පරම්පාරාව සඳහා ද භාවිතයට අවස්ථාව ලබා දීම, භාවිත නොකල අභ්‍යාස පොත්වල පිටු එක්රැස් කර දගර හෝ ප්ලාස්ටික් බැඳුම් යොදන ලද සටහන් පොත් සකස් කිරීම වැනි)

6. පාසලේ එකතුවන දිරාපත් වන කාබනික අපද්‍රව්‍ය යොදා ගෙන කුඩා ජීවවායු ජනක නිර්මාණය කිරීම හා නිෂ්පාදනය වන ජීවවායුව පාසලේ රසායනාගාර ගෘහ විද්‍යාගාර හා ආපනශාලාවල ජලය රත් කිරීම වැනි කටයුතු සඳහා යොදා ගැනීම හා එම උත්සාහයන්හි සාර්ථකත්වයේ සිද්ධි අධ්‍යයනයන් සකස් කර ප්‍රචාරණය කිරීම.

7. පාසල් භූමියේ කොම්පෝස්ට් පොහොර නිපදවීම.

8. කොම්පෝස්ට් පොහොර භාවිතයෙන් කාබනික එළවළු නිෂ්පාදනය (මේ සඳහා ඉහත සකස් කරන ලද කොම්පොස් භාවිතා කිරීම සිදුකළ හැකිය).

9. කාබනික එළවළු, හරිත අත්කම් භාණ්ඩ වැනි හරිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ප්‍රදේශයේ ඇති සුපිරි වෙළඳපොල සැපයුම් දාමයන් හා සම්බන්ධවීම.

10 පාසලේ ජල සංරක්ෂණය සඳහා කටයුතු කිරීම.

11. වැසි ජල සංරක්ෂණය සහ භාවිතය සඳහා සැලසුම් සකස් කිරීම (ජල සැපයුමක් ලබා දීමට නොව වර්ෂා ජලය එකතු කර භාවිත කිරීම සඳහා ආධාර ඉල්ලන්න.)

12. පාසල තුළ සියලු සම්පත් සුරැකීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (සම්පත්වල ජීවන කාලය, ජීවන චක්‍ර විශ්ලේෂණය හා අදාළ පාරිසරික බලපෑම් අදාළ කර ගෙන)

13. දේශීය ආහාර භාවිතයට පුරුදු පුහුණුවීම





ආසියා රැහැන්මාරා
Asian Paradise - Flycatcher
*Terpsiphone paradisi*